දැන්වීමයි

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා තක්සේරු සේවයේ I පන්තියේ III ශ්‍රේණියේ තක්සේරුකරු තනතුරට සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත පත් කිරීම - 2020 ශ්‍රී ලංකා තක්සේරු සේවයේ I වන පන්තියේ III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු 63 ක ප්‍රමාණයක් සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත පිරවීම සඳහා, මෙම දෙපාර්තමේන්තුවේ පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා තක්සේරු සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ සහකාර තක්සේරුකරුවන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2020.12.16 දින වේ.

සටහන: ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට නොඅඩු අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාවක් එම නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය අනුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. මූලික සුදුසුකම් පරීක්ෂක්‍ෂා කිරීමද යෝග්‍යතා ඇගයීමේ පරීක්ෂණයේදී සිදු කරනු ලැබේ.

එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

02. සුදුසුකම්

i. ශ්‍රී ලංකා තක්සේරු සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ සහකාර තක්සේරුකරුවකු වීම.

ii. ක්ෂේත්‍ර/කාර්යාලගත නිලධාරී බණ්ඩ 11ට අදාළව II පන්තියේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව තිබීම.

iii. අයදුම්පත් කැඳවන ගැසට් නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට හා එහි සංශෝධනයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි

i. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනන්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

ii. මෙම පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ය.

iii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි සඳහන් විධිවිධාන හා ඊට අනුශාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

iv. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, දෙපාර්තමේන්තු නියෝග රජය මගින් නිකුත් කර ඇති හා නිකුත් කරනු ලබන නියෝග වලට යටත් වේ.

04. වයස් සීමාව

අදාළ නොවේ.

05. වැටුප් පරිමාණය

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය රු. 47,615-10X 1,335-8X1,630-17X2,170-110,895(SL-1-2016) වේ.

06. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

අනු අංකය	විෂයය		උපරිම ලකුණු
01	**ජ්‍යෙෂ්ඨත්වය** 2007.05.28 දිනැති අංක 1499/5 දරන ශ්‍රී ලංකා තක්සේරු සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා තක්සේරු සේවයේ III පන්තියේ I ශ්‍රේණියේ/ 2019.09.27 දිනැති අංක 2142/75 දරන ශ්‍රී ලංකා තක්සේරු සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා තක්සේරු සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ සේවා කාලය (රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 හි සඳහන් විධිවිධානයන්ට හා එහි සංශෝධනයන්ට අනුකූලව ලකුණු ගණනය කිරීම සිදුවේ.)		60
02	**කුසලතාවය** I. **බඳවා ගැනීමේ මූලික සුදුසුකමට අමතරව ලබාගත් අතිරේක අධ්‍යාපන සුදුසුකම් - (තනතුරට අදාළ වන ක්ෂේත්‍රයන් තුළ)** 1.1. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ තත්‍ය දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ පශ්චාත් උපාධිය (MSc in Real Estate Management &Valuation) (ලකුණු 12) **හෝ** එක්සත් රාජධානියේ රෙඩින් විශ්ව විද්‍යාලය (University of Reading-UK)/ එක්සත් රාජධානියේ තත්‍ය දේපළ කළමනාකරණය පිළිබඳ විශ්වවිද්‍යාල ආයතනය (University College of Estate Management) මගින් පිරිනමන තත්‍ය දේපළ පිළිබඳ පශ්චාත් උපාධිය (MSc in Real Estate) (ලකුණු 12) 1.2 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තත්‍ය දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ලකුණු 06) (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)	12	30
	II. **වෘත්තීය සුදුසුකම්** 1.1. අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ වෘත්තීය ආයතනයන්හි සාමාජිකත්වය සඳහා 1. ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය (Institute of Valuers of Sri Lanka)- (ලකුණු -05) **හෝ** 2. එක්සත් රාජධානියේ වරලත් මිනින්දෝරුවන්ගේ රාජකීය ආයතනයේ තක්සේරු සාමාජිකත්වය (Members of Royal Institute of chartered Surveyors/ Fellow of the Royal Institute of chartered Surveyors) (ලකුණු -03) 1.2. තක්සේරු වෘත්තියේ බඳවාගනු ලබන තනතුරට අදාළව ඉහත 2.1.1.1. හා 2.1.1.2 ට අමතරව පිළිගත් ආයතනයකින් ලබාගත් දේශීය හා විදේශීය වසරක් හෝ ඊට වැඩි කාලයක පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 01 බැගින් උපරිමය ලකුණු 03) (ලකුණු 03)	08	
	III. වාර්ෂික කාර්ය සාධනය දෙපාර්තමේන්තුගත කාර්ය සාධන ඇගයුම් ක්‍රමවේදයට අනුව පසුගිය වසර 05ක සමස්ථ කාර්ය සාධන ඇගයුම 01. විශිෂ්ඨ කාර්ය සාධනය (මාසික සාමාන්‍යය 17.5ට වැඩි) (ලකුණු 10) 02. සාමාන්‍ය කාර්ය සාධන මට්ටම (මාසික සාමාන්‍යය 12.5- 17.49) (ලකුණු 07) 03. සතුටුදායක කාර්ය සාධන මට්ටම (මාසික සාමාන්‍යය 10.0-12.49) (ලකුණු 05)	10	
03	සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය සඳහා		10
	මුළු එකතුව		100

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. පසුව ඉදිරිපත් කරනු ලබන ලේඛනවලට ලකුණු ලබා දෙනු නොලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

08. අයදුම්පත් ඉදිරිපත් කිරීම

i. අයදුම්පත් 2020.12.16 දිනට ඉහත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් මෙම නිවේදනය අවසානයට දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව සම්පූර්ණ කර දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2020.12.16 දිනට ප්‍රථම මා වෙත ලියාපදිංචි තැපැලෙන් ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. සාවද්‍ය තොරතුරු සැපයීම

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඔහුම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි

ලේකම්,
මුදල් අමාත්‍යාංශය,
මහලේකම් කාර්යාලය, කොළඹ 01.

විධායක නිලධර ගණයේ ශ්‍රී ලංකා තක්සේරු සේවයේ I පන්තියේ III ශ්‍රේණියේ තක්සේරුකරු, තනතුර සඳහා සේවා පළපුරුද්ද හා කුසලතාවය මත බඳවා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ____________________
2. ජාතික හැඳුනුම්පත් අංකය : ____________________
3. උපන් දිනය : ____________________
4. 2020.12.16 දිනට වයස : අවු: ________ මාස: ________ දින: ________
5. දැනට දරණ තනතුර ________ පන්තිය ________ ශ්‍රේණිය ________
6. මුල් පත්වීමේ දිනය ________ මුල් පත්වීමේ තනතුර ________
7. අංක 1499/5 දරන ශ්‍රී ලංකා තක්සේරු සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුව III පන්තියේ I ශ්‍රේණියට පත්වූ දිනය : ____________________
8. අංක 2142/75 දරණ ශ්‍රී ලංකා තක්සේරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව II පන්තියේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ දිනය : ____________________
9. අමතර අධ්‍යාපන සුදුසුකම් :- (ආයතන හා අදාළ වර්ෂයන් සහිතව සඳහන් කරන්න.)
   i. ____________________
   ii. ____________________
   iii. ____________________
10. වෘත්තීමය සුදුසුකම්
   i. ____________________
   ii. ____________________
   iii. ____________________

ඉහත සඳහන් තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට සහතික කරමි.

අයදුම්කරුගේ අත්සන ________ දිනය :- ________

ප්‍රධාන තක්සේරුකරු,

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

____

අංශ ප්‍රධානියාගේ අත්සන දිනය : ________

නිලමුද්‍රාව

අයදුම්පත් භාරගත් බවට දිනය ඇතුළත් කර ලදුපතක් අයදුම්කරු වෙත නිකුත් කළ යුතුය.